මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/14**

**2025.03.14**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

### නාමයෝජනා පත්‍ර භාරදීම සම්බන්ධයෙනි

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරදීමට අපේක්ෂිත දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් පහත සඳහන් විශේෂ කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

- නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කරන ලද නාමයෝජනා පත්‍රයේ එක් පිටපතක් පමණක් ඒ සඳහා අමුණා තිබිය යුතු සියලු ඇමුණුම් සහිතව නියමිත කාලසීමාව තුළ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත භාරදීම; සහ

- තරුණ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැති විටක සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු විසින් සහතික කළ වයස සනාථ කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් නාමයෝජනා පත්‍රයට අමුණා තිබිය යුතු ය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්